උත්ථාන සමය සතරවන ඉරුදින **දේව ප්‍රකාශන** 29-04-12

**පළමුවන කියැවීම** ක්‍රියා 4:8-12

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයකි.

**අපට ගැළවීම සලසන අන් කිසි නාමයක් මුලු ලොවෙහිම නොමැත්තේ ය.**

එවිට පේදුරු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව ඔවුන් අමතා මෙසේ කීය. "ප්‍රධානයෙනි, ප්‍රජා මූලිකයෙනි, කොර මිනිසෙකුට කරන ලද කාරුණික ක්‍රියාව ගැන හා ඔහු සුවපත් කරන ලද්දේ කෙසේ ද යන්න ගැන හා අද අපි විමසමු ලබමු නම්, එයට අපේ පිළිතුර මෙසේය. ඔබ විසින් කුරුසියේ ඇණ ගසන ලද්දා වූ ද දෙවියන් වහන්සේ විසින් උත්ථාන කරන ලද්දා වූ ද නාසරෙත්හි ජේසුස් වහන්සේගේ අනුහසින් ඔබ ඉදිරියෙහි මේ මිනිසා සුව සම්පන්නව සිටියි. ඒ බව ඔබ සියලු දෙනාත්, මුලු ඊශ්‍රායෙල් ජනයාත් දැන ගනිත්වා. උන්වහන්සේ වනාහි ගෘහ ශිල්පීන් වන ඔබ විසින් ප්‍රතික්ෂේප කරන ලද ගලය. එහෙත් උන්වහන්සේම ප්‍රධාන ගල වූ සේක. අන් කිසිවෙකු මගින් ගැළවීමක් නැත. මන්ද, අපේ ගැළවීම සලසා දෙන ලද අන් කිසි නාමයක් මුලු ලොවෙහි ම මිනිසුන් අතරේ නැත. දේව වාක්‍යය එසේ ය.

**පිළිතුරු ගීය** ගීතාවලිය 118:8-9,21-23,26,28-29

පිළිතුර: ගෘහ ශිල්පීන් ඉවතලූ ගලම මුල් ගල වී ඇත.

ගීය; සමිඳුන්ට ස්තුති කරන්න. මන්ද එතුමාණෝ යහපත්ය. එතුමන්ගේ තිර පෙම සදාකාලයටම පවත්නේය. මිනිසා කෙරෙහි විශ්වාසය තැබීමට වඩා සමිඳුන් කෙරෙහි විශ්වාසය තැබීම යහපත.

අධිපතීන් කෙරෙහි විශ්වාසය තැබීමට වඩා සමිඳුන් කෙරෙහි විශ්වාසය තැබීම යහපත. මම ඔබට ස්තුති කරන්නෙමි. මන්ද, ඔබ මට පිළිතුරු දී මාගේ ගැළවීම වූ සේක.

ගෘහ ශිල්පීන් ඉවතලූ ගලම මුල් ගල වී ඇත. මෙය සමිඳුන්ගේ ක්‍රියාවකි. එය අපේ දෙනෙතට අසිරිමත්ය. සමිඳුන්ගේ නාමයෙන් වඩින තැනැත්තේ ආසිරි ලද්දෙකි. සමිඳුන්ගේ මාළිගාවේ සිට අපි ඔබට ආසිරි පතමු.

ඔබ මාගේ දෙවිඳුණෝය. මම ඔබට ස්තුති කරන්නෙමි. ඔබ මාගේ දෙවිඳුණෝය. මම ඔබට උස් හඬින් පැසැසුම් ගී ගයන්නෙමි.

සමිඳුන්ට ස්තුති කරන්න. මන්ද එතුමාණෝ යහපත්ය. එතුමන්ගේ තිර පෙම සදා පවත්නේය.

## දෙවන කියැවීම

1 ජුවාම් 3:1-2

ශුද්ධ වූ ජුවාම් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**උන්වහන්සේගේ ප්‍රකෘති ස්වභාවයෙන්ම ම**
**අපි උන්වහන්සේ දකින්නෙමු.**

බලන්න, පියාණන් වහන්සේ අපට කෙතරම් ප්‍රේම කර ඇද්ද? අපි දෙවියන් වහන්සේගේ දරුවෝ යයි කියන තරමට උන්වහන්සේ අපට ප්‍රේම කළ සේක. ඇත්තෙන්ම අපි උන්වහන්සේගේ දරුවෝ මය. ලෝකයා දෙවියන් වහන්සේ නොපිළිගන්නා බැවින් ඔවුහු අප ද නොපිළිගන්නෝය. ප්‍රේමවන්තයෙනි, අපි දැනටම දෙවියන් වහන්සේගේ දරුවෝ ය. එහෙත් අනාගතයේදී අපි කොයි ආකාර අය වන්නෙමුදැයි තවම ප්‍රකාශ වී නැත. කෙසේ වෙතත් උන්වහන්සේ ප්‍රකාශ වන විට අපි උන්වහන්සේ ට සමාන බව අපි දනිමු. මන්ද, උන්වහන්සේගේ ප්‍රකෘති ස්වභාවයෙහි ම අපි උන්වහන්සේ දකින්නෙමු.

දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

ජුවාම් 10:14

ආලේලූයා! ආලේලූයා!

“මම යහපත් බැටළු එඬේරා වෙමි. මම මගේ බැටළුවන් අඳුනමි.
ඔව්හු ද මා අඳුනන්නෝ ය.”යි ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජුවාම් 10:11-18

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**මාගේ බැටළුවන් උදෙසා දිවි පුදන යහපත් එඬේරා මම වෙමි.**

“යහපත් එඬේරා මම වෙමි. යහපත් එඬේරා, තම ජීවිතය බැටළුවන් උදෙසා පූජා කරන්නේය. එඬේරෙකු නොවන, එසේම බැටළුවන්ගේ අයිතිකාරයාද නොවන කුලීකාරයා, වෘකයා එනු දැක බැටළුවන් හැරදමා පලා යන්නේය. වෘකයාද උන් වෙත කඩා පැන විසුරුවා හරින්නේය. ඔහු පලා යන්නේ ඔහු කුලීකාරයෙකු වන නිසාත්, බැටළුවන් ගැන සැලකිල්ලක් ඔහුට නැති නිසාත්ය. යහපත් බැටළු එඬේරා මම වෙමි. මම මගේ බැටළුවන් අඳුනමි. ඔව්හු ද මා අඳුනති. පියාණන් වහන්සේ මා ද මා පියාණන් වහන්සේ ද, අඳුනන්නාක් මෙන්, මම මාගේ බැටළුවන් අඳුනමි. බැටළුවන් උදෙසා මාගේ දිවි පුදමි. තවද, මේ රැළට අයිති නොවූ අන් බැටළුවෝ ද මට ඇත්තාහ. මා ඔවුන් ද ගෙන ආ යුතුය. ඔව්හු මාගේ හඬට ඇහුම්කන් දෙති. මෙසේ එක රැළක් ද එක එඬේරෙක් ද වන්නාහ. මා පියාණන් මට ප්‍රේම කරන්නේ, මා නැවත ලබන පිණිස මාගේ දිවි පුදන බැවිනි. කිසිවෙක් එය මගෙන් පැහැර නොගනිති. මාගේම කැමැත්තෙන් මම එය පුදමි. එය පුදන්නට මට බලය තිබේ. එය යළි ලබන්නට ද මට බලය තිබේ. මේ නියමය මාගේ පියාණන් වහන්සේගෙන්ම ලදිමි” යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය.